කැළණිය විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි තෙවන වසර පරීක්ෂණය (බාහිර )-2013

2016 -ඔක්තෝබර්

**BCOM E 3063 - බදුකරණය**

ප්‍රශ්න සංඛ්‍යාව : 05 කාලය : පැය 03 යි

සියලුම ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.

---

01. 2014/2015 තක්සේරු වර්ෂය සඳහා ජයමිණි අතුකෝරළ මහත්මියගේ ආදායම් සහ වියදම් ඔබට ලබාදී ඇත.

<u>ව්‍යාපාර ලාභය</u>

අතුකෝරළ මහත්මියට තනි පුද්ගල ව්‍යාපාරයක් හිමි අතර වර්ෂය තුළ රු. 6780,000 ක ශුද්ධ ලාභයක් උපයා ඇත. දූරූ වියදම් වලින් රු. 1000,000 ක් ඉඩ නොදෙන වියදම් වේ. තවදුරටත්, 2013/2014 තක්සේරු වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ බදුවන ව්‍යාපාර අලාභය රු. 1025,000 කි.

<u>සේවානියුක්ති ආදායම</u>

ඇය ඕලු බර්ඩ් සමාගමේ මූල්‍ය පාලක ලෙස කටයුතු කරන ලද පහත ප්‍රතිලාභ වර්ෂය තුළදී ලැබිණි.

- මාසික වැටුප - රු. 100,000
- ස්ථාවර දීමනා - මාසිකව රු. 60,000
- සේවක අර්ථ සාධක අරමුදලට සේව්‍යයාගේ දායකත්වය රු. 252,000
- නිවාඩු දීමනා - රු. 20,000
- දුරකථන බිල් ප්‍රතිපූර්ණය - රු. 25,000
- විදුලිය බිල් ප්‍රතිපූර්ණය - රු. 13,500
- ප්‍රසාද දීමනා - රු. 200,000
- අතුකෝරළ මහත්මියට මෝටර් රථ දෙකක් සපයා ඇති අතර එයින් එක් මෝටර් රථයක් සඳහා ඇය නිවැරදි පෞද්ගලික ගමන් වාර්තා තබාගෙන ඇත. එම වාර්තා අනුව 2014/2015 තක්සේරු වර්ෂය සඳහා ඇයගේ පෞද්ගලික ගමන් කිලෝ මීටර 6000 කි. අනෙක් මෝටර් රථය ධාරිතාව 1500 cc ට අඩු වන අතර එය රියදුරෙකු සමඟ ඉන්ධන නොමැතිව සපයා ඇත.
- සමාගම කිසිදු වෛද්‍ය රක්ෂණ දායකත්වයක් එහි සේවකයන්ට සිදු කර නැත. නමුත් අතුකෝරල මහත්මිය 2014 ඔක්තෝම්බර් මාසයේදී රු. 10,000 ක වෛද්‍ය බිලක් ප්‍රතිපූර්ණය කර ගෙන ඇත.

- අතුකෝරල මහත්මියට අඩු කුලියට නිවසක් සපයා දී ඇත. නිවසේ වරිපනම් තක්සේරුව රු. 220,000 ක් වන අතර වරිපනම් 20% කි. සමාගම නිවසේ අයිතිකරුට රු. 30,000 ක මාසික කුලියක් ගෙවනු ලැබේ. සමාගම අතුකෝරළ මහත්මියගෙන් රු. 10,000 ක මාසික කුලියක් අයකර ගනු ලැබේ.

<u>දේපළ ආදායම</u>

2010/20011 තක්සේරු වර්ෂයේදී අතුකෝරල මහත්මිය ඇයගේ නිවාස වලින් එකක් වාසස්ථාන ඒකක වලට පරිවර්තනය කළ අතර පළාත් පාලන ආයතනය එම එකිනෙක ඒකකය වෙත වෙනම තක්සේරු කරනු ලැබේ.. වරිපනම් 30 % කි.

| ඒකක අංකය | බිම් ප්‍රමාණය (වර්ග අඩි) | මාසික දළ කුලිය (රු) | වරිපනම් තක්සේරුව (රු) |
|---|---|---|---|
| 1 | 2,500 | 45,000 | 120,000 |
| 2 | 800 | 10,000 | 55,000 |
| 3 | 1,800 | 25,000 | 95,000 |

- අනෙක් නිවසේ වරිපනම් තක්සේරුව රු. 220,000ක් වන අතර වරිපනම් 30 % කි. ඇය එම නිවස ඇයගේ වාසස්ථානය සඳහා යොදා ගනී.

<u>පොළී ආදායම</u>

අතුකෝරළ මහත්මියට වර්ෂය තුල මූල්‍ය සමාගමක සිදු කර ඇති ස්ථාවර තැන්පතුවක් සඳහා රු. 600,000 ක ශුද්ධ පොළියක් ලැබිණි.

<u>ලාභාංශ ආදායම</u>

වර්ෂය තුළ රු. 300,000 ( සමාගම ගෙවූ බදු වෙනුවෙන් රඳවාගැනීමේ බදු අඩු කර ගෙන නැත) ලාභාංශ ආදායමක් ලැබිණි.

<u>වියදම්</u>

i. පෞද්ගලික වියදම් - රු. 980,000

ii. පොලී වියදම්

  - ඇගේ ව්‍යාපාරයේ ගොඩනැගිල්ල මිලදී ගැනීමට ලබා ගත් ණය සඳහා - රු. 405,000
  - ඇගේ වාසස්ථානය ඉදි කිරීමට ලබා ගත් ණය සඳහා - රු. 270,000

iii. අතුකෝරළ මහත්මිය වර්ෂය තුළදී ව්‍යාපාර වස්තු සමාගමකින් රු. 1000,000 ක් වටිනා කොටස් මිලදී ගෙන ඇත.

iv. නිවාස ණයෙහි ප්‍රාග්ධන ගෙවීම - රු. 890,000

v. අනුමත පුණ්‍යායතනයකට සිදු කළ මුදල් ආධාර රු. 100,000කි.

vi. ස්වයං තක්සේරු ක්‍රමය මත බදු ගෙවීම් කාර්තුවකට රු. 6000 කි.

ඔබ විසින් ගණනය කළ යුතු වන්නේ, 2014/2015 තක්සේරු වර්ෂය සඳහා අතුකෝරළ මහත්මියගේ,

i මුළු ව්‍යවස්ථාපිත ආදායම

ii. තක්සේරුගත ආදායම

iii. බදුවන ආදායම

iv. අවසාන බදු වගකීම

(මුළු ලකුණු 40)

02. ජවර්ධන ස්ටෝර්ස් ශ්‍රී ලංකාවේ බදු ගෙවන්නෙකු වන ගයාන් ජයවර්ධන මහතාට අයිති තනි පුද්ගල ව්‍යාපාරයක් වේ. ඔහු විසින් 2014/2015 තක්සේරු වර්ෂයට ගලපන ලද ව්‍යාපාර ලාභය ගණනය කිරීම සඳහා පහත තොරතුරු ඔබට සපයා දී ඇත.

1. මූල්‍ය ප්‍රකාශන අනුව ශුද්ධ ලාභය රු. 8730,000 කි. ව්‍යාපාරය එහි විකුණුම් වලින් වර්ෂය තුළදී රු. 18,600,000 ක පිරිවැටුමක් උපයා ඇත. පසුගිය වර්ෂයේ ගළපන ලද ලාභය රු. 2820,000 කි.

2. 2015 මාර්තු 31 දිනට දේපළ, පිරියත හා උපකරණ වල විස්තර

<u>සින්නක්කර දේපළ</u>

| වත්කම | මිලදීගත් වර්ෂය | පිරිවැය |
|---|---|---|
| ඉඩම් | 2008/2009 | 13,000,000 |
| ගොඩනැගිලි-සාප්පුව | 2007/2008 | 900,000 |
| ගොඩනැගිලි - ගබඩාව | 2012/2013 | 1,100,000 |
| සාප්පු උපකරණ | 2009/2010 | 65,000 |
| කාර්යාල ලීබඩු | 2013/2014 | 275,000 |
| පරිඝනක | 2014/2015 | 78,000 |
| මෝටර් කාරය | 2012/2013 | 1,500,000 |

<u>බදු වත්කම්</u>

2014 අප්‍රේල් 01 දින ව්‍යාපාරය වර්ෂ තුනක බදු ගිවිසුමක් යටතේ බෙදාහැරීමේ වෑන් රථයක් මිලදී ගෙන ඇත. මාසික කුලිය රු. 95,672 කි. ව්‍යාපාරය මුළු වාරිකය වර්ෂය තුලදී නියමිත දියන්හි ගෙවා ඇත.

<u>වත්කම් ඉවත්කිරීම්</u>

2014 ජූලි 15 දින, 2010/2011 වර්ෂය තුලදී මිලදී ගත් රු. 72,000 ක් පිරිවැය වූ පරණ පරිඝනකයක් රු. 54,000 කට විකුණන ලදී. විකුණන දිනයට වත්කම් ශුද්ධ පොත් අගය රු. 12,000 කි. මූල්‍ය ප්‍රකාශන වත්කම ඉවත් කිරීමේ ලාභය එහි අනෙකුත් ආදායම් වල හඳුනා ගෙන ඇත.

3. ඉහත ලාභය ගණනය කිරීම සඳහා පහත වියදම් ද ආදායම් ප්‍රකාශනයේ අයකර ගෙන ඇත.

| | රු. |
|---|---|
| ගණකාධිකාරීගේ ගාස්තු | 20,000 |
| ප්‍රචාරණය | 10,000 |
| ක්ෂය | 2,100,000 |
| විකුණුම් ප්‍රවර්ධන | 42,000 |
| ජයවර්ධන මහතාගේ ගැනිලි | 400,000 |
| බැංකු අයිරා පොළී | 13,000 |
| ඉඩමක් මිලදී ගැනීමේ නීතිමය ලියකියවිලි පිලියෙල කිරීම සඳහා නීතිඥයාට ගෙවූ වෘත්තීමය ගාස්තු | 68,000 |
| වාණිජ්‍ය මණ්ඩලයට ගෙවූ සමාජික ගාස්තු | 10,000 |
| විදේශීය ගමන් - පෞද්ගලික | 360,000 |
| විදේශීය ගමන් - ඉන්දියාවේ ව්‍යාපාර සම්මුතියකට සහභාගිවීම සඳහා | 95,000 |
| පුහුණු වියදම් - අලෙවි කළමනාකරුවන්ගේ අලෙවි කුසලතා වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා කළමනාකරු ආයතනය හසුරුවන ලද වැඩමුළුවකට - ව්‍යාපාරයේ අලෙවි කළමනාකරු මේ සඳහා සහභාගී වූ අතර ඔහු ව්‍යාපාරයේ සමහර ක්ෂේත්‍ර වැඩි දියුණු කිරීම සඳහා දැනුමක් ලබා ගන්නා ලදී. | 60,000 |
| පසුගිය වර්ෂයේ ආදායම් බදු ගොනු කිරීම සම්බන්ධයෙන් තක්සේරු කිරීමට අභියාචනාවක් කෙටුම්පත් කිරීමට බදු උපදේශකට ගෙවීම් | 12,000 |
| වැඩිහිටි නිවාසයකට ආධාර | 5,000 |
| කාර්ය මණ්ඩල වැටුප් | 540,000 |
| බිරිඳගේ වැටුප - මුදල් අයකැමි ලෙස කටයුතු කිරීම සඳහා | 140,000 |
| සේවක අර්ථ සාධක අරමුදල් | 28,800 |
| පාරිතෝෂිත වෙන් කිරීම් - වර්ෂය තුලදී පාරිතෝෂිත ගෙවීමක් සිදු කර නැත | 65,000 |
| කල්බදු සඳහා පොලී | 125,000 |
| බදු කුලී | 100,000 |
| භාණ්ඩ ප්‍රවාහනය | 57,000 |

ඔබ විසින් 2014/2015 තක්සේරු වර්ෂය සඳහා ජයවර්ධන ස්ටෝර්ස්හි ගලපන ලද ලාභය ගණනය කළයුතු වේ.

(මුළු ලකුණු 25)

03. අ. ආදායම් බදු අරමුණ සඳහා දේපළ ආදායම් ප්‍රභව කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ආ. ජයපාල මහතා ඔහුගේ අනුරාධපුර නිවසක් රු. 6000/- ක මාසික කුලියකට ඥාතියෙකුට ලබාදී ඇත. නිවසේ වරිපනම් තක්සේරුව රු. 120,000/- ක් වන අතර වරිපනම් 20 % කි.

2014/2015 තක්සේරු වර්ෂය සඳහා මෙම නිවසට ජයපාල මහතාගේ කුලී ආදායම සහ ඔහුගේ ඥාතියාගේ ආදායම (තිබේ නම්) ගණනය කරන්න.

(ලකුණු 04)

ඇ. කුමාර මහතාට නිවාස 7 ක් හිමි අතර 2014/2015 තක්සේරු වර්ෂය සඳහා පහත විස්තර ලබා දී ඇත. 2014/2015 තක්සේරු වර්ෂය බදු වන ශුද්ධ වාර්ෂික වටිනාකම ගණනය කරන්න. කුමාර මහතා හෝ ඔහු වෙනුවෙන් ඔහුගේ පවුලේ කෙනෙකු මෙම නිවාස වල පදිංචි වී සිටී.

| නිවස | ස්වභාවය | වර්ෂය | ශුද්ධ වාර්ෂික වටිනාකම (රු) |
|---|---|---|---|
| 01 | මිලදී ගත් | 2003.04.30 (1988 ඉදිකළ) (වර්ග අඩි 2100) | 200,000 |
| 02 | ඉදිකළ | 2006 පෙබරවාරි ( වර්ග අඩි 2000) | 100,000 |
| 03 | මිලදී ගත් | 2006.05.20 (2006.01.20 ඉදිකළ) (1200 වර්ග අඩි) | 450,000 |
| 04 | මිලදී ගත් | 2008, අප්‍රේල් (2008.04.01 ඉදිකළ) ව.අඩි.500) | 325,000 |
| 05 | ඉදිකළ | 2010 මැයි ( ව. අඩි 450) | 310,000 |
| 06 | ඉදිකළ | 2011 අප්‍රේල් (ව.අඩි. 1250) | 220,000 |
| 07 | පරිවර්තනය<br>ඒකක 1 (වර්ග අඩි 900)<br>ඒකක 2 (වර්ග අඩි 1800) | 2010 පෙබරවාරි | 135,000<br>267,000 |

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

04. පහත දෑ පැහැදිලි කරන්න.

අ. ව්‍යවස්ථාපිත ආදායම

ආ. දරුවා

ඇ. පුද්ගලයා

ඉ. සෘජු බදු

ඊ. නිර්වාසික පුද්ගලයා

(මුළු ලකුණු 10)

05. අ. ආදායම් බදු වාර්තාවේ දක්වන මූලිකාංග පහෙන් හතරක් සපුරන ඕනෑම පුද්ගලයෙකු එම අවශ්‍යතාවය සපුරාලීමෙන් මාසයක් ඇතුලත ආදායම් බදු වාර්තාවක් ගොනු කළ යුතු වේ. එම මූලිකාංග මොනවාද ?

(ලකුණු 02)

ආ. අදායම් බදු මූලධර්ම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 03)

(මුළු ලකුණු 05)